සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் தவணைப் பரீட்சை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 13 | විෂයය / பாடம் / Subject } නාට්‍ය හා රංග කලාව I | පත්‍රය / வினாத்தாள் / Paper } I | පැය / மணித்தியாலம் / Hours } 3 |

උපදෙස් :

*I - කොටස - සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයා , II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

* II කොටස - A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන, ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

**1 කොටස**

- නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

01. "නාට්‍ය යනු අවස්ථා අනුකරණය කිරීමකි" මෙම නිර්වචනය පවසන ලද්දේ කවරෙක්ද?
( 1) භරතමුනි. (2) ඇරිස්ටෝටල්. (3) ධනංජය. (4) බර්නාඩ් ෂෝ. (5) අභිනව ගුප්ත (...........)

02. නෘත්‍ය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
(1) ආංගික හා සාත්වික අභිනයන් මගින් කිසියම් භාවයක් ප්‍රකට වන නර්තනයකි.
(2) වාචික අභිනයෙන් තොර අභිරූපණයකි.
(3) ආහාර්ය අභිනයෙන් තොර රංගනයකි.
(4) හුදු රිද්මයානුකූල නර්තනයකි.
(5) අර්ථ විරහිත රිද්මයකි. (...........)

03. දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ පුරෝගාමියා වන්නේ කවුරුන්ද?
(1) මහාචාර්ය ආරියරත්න කළුආරච්චි මහතා.
(2) වසන්ත කුමාර මහතා.
(3) ආචාර්ය චිත්‍රසේන්න මහතා.
(4) ආචාර්ය මුදියන්සේ දිසානායක මහතා.
(5) චන්න විජේවර්ධන මහතා. (...........)

04. නූර්තිය , නාඩගමින් වෙනස් වන විශේෂ ලක්ෂණයක් වන්නේ
(1) යක්බෙරය භාවිත කිරීමයි.
(2) කාන්තාවන් රංගනයේ යෙදීමයි.
(3) නාට්‍ය පෙළක් නොතිබීමයි.
(4) නාට්‍යධර්මී සාම්ප්‍රදාය භාවිත කිරීමයි.
(5) ගීත අඩංගු නොවීමයි. (...........)

05. සොකරි නාටකයේ එන චරිතයක් වන්නේ,

(1) පච්චමීරා (2) පනික්කලේ (3) සබේච්දානේ (4) කාලි අම්මා (5) සෙල්ලපිල්ලේ (...........)

06. අඹවිදමන හා මරා ඉපැද්දීම අයත් වන්නේ කවර ශාන්ති කර්මයකටද?

(1) රිද්දියාගය.

(2) සූනියම් කැපිල්ල

(3) මහසොන් සමයම

(4) ගම්මඩු

(5) සන්නි යකුම (...........)

07. ආරම්භයේ දී පාස්කු නාට්‍ය වඩාත් ම ප්‍රචලිත වූ ප්‍රදේශ වන්නේ

(1) මහනුවර, මාතලේ, බදුල්ල,දූව

(2) පමුණුගම,මහනුවර, හලාවත,දූව

(3) පේසාලේ,යාපනය, මීගමුව,දූව

(4) පිටිපන, කුරුණෑගල , මඩකලපුව,දූව.

(5) බදුල්ල,කොළඹ, දූව,මොණරාගල (...........)

08. මිනර්වා නාට්‍යවලට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ ,

(1) සංගීතය මෙහෙයවන ලද්දේ උත්තර භාරතීය රාගධාරී සංගීතඥයින් විසිනි.

(2) එඩී ජයමාන්න හා රුක්මනි දේවී මිනර්වා නාට්‍ය වල නළු නිළියන් විය .

(3) සියලුම නාට්‍ය රචනා කරන ලද්දේ ජෝන් ද සිල්වා විසිනි.

(4) විශ්ව විද්‍යාල නාට්‍ය යුගයෙන් පසු ව බිහිවූ නාට්‍ය විශේෂයකි.

(5) තත්කාලීන සමාජ සිද්ධීන් මෙම නාට්‍ය වල දැකිය නොහැකිය. (...........)

- පහත දැක්වෙන සංස්කෘත නාට්‍ය කලාව හා සම්බන්ධ වචන ඇසුරින් අංක 09 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| A | කඤ්චුකී. | E | අපවාරිත භාෂණ |
| B | ආනුභාව | F | බින්දු |
| C | නියතාප්ති | G | රහස්‍ය කථනය |
| D | චූලිකා | H | ව්‍යාජිම |

09. සංස්කෘත නට්‍යවල අර්ථෝපක්ෂේප වලට අයත් අංගයක් වන්නේ.

(1) A (2) B (3) C (4) D (5) E (...........)

10. අභිඥාන ශාකුන්තලයෙහි, රජුගේ අන්තඃපුරයේ පාලකයා වන්නේ කවුරුන් ද ?

(1) A (2) B (3) C (4) H (5) E (...........)

11.සංස්කෘත නාට්‍යවල වේදිකාව මත එක් චරිතයක් තවත් එක් චරිතයකට පමණක් ඇසෙන සේ සෙසු චරිත වලක්වා කතා කිරීම හඳුන්වන නම කුමක්ද ?

(1) A (2) B (3) C (4) G (5) E (...........)

12 . සිනහව , මුහුණ රතුවීම, කඳුළු සැලීම, නෙතඟ බැලුම් වැනි දේ මගින් චරිතයේ මනෝභාවය ප්‍රකට කිරීම යනු කුමක්ද. ?

(1) A (2) B (3) C (4) D (5) E (...........)

13. නේතෘගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇති බාධක ඉවත් කිරීම යනු කුමක්ද ?

(1) B (2) C (3) D (4) E (5) F (...........)

14 .සකුන්තලාට දුන් මුදුව දැකීමෙන් දුෂ්‍යන්තගේ මතකය අවදි වීමේ අවස්ථාව යනු,

(1) B (2) C (3) D (4) E (5) F (...........)

15 .නූතන ප්‍රොසීනියම් වේදිකාව මන:කල්පිත ව බෙදා දක්වන කොටස් ගණන කීයද?
(1) තුනකි. (2) අටකි. (3) දහයකි. (4) නවයකි. (5) හතකි. (...........)

16 .රංගාලෝක භාවිතයේ දී නළුවා හඹාගොස් ආලෝකය සපයන පහන් වර්ගය කුමක්ද?
(1) හැලජන් පහන (2) යොමු පහන (3) ධාරාලෝක පහන
(4) පැන්නුම් පහන (5) අල්ට්‍රා වයලට් පහන (...........)

17 .නාට්‍ය ධර්මී නාට්‍යයක ලක්ෂණයක් වන්නේ,
(1) වේදිකා සැරසිලි බහුල වීම
(2) සතර අභිනය අවම වශයෙන් භාවිත වීම
(3) ආත්ම භාෂණය වලින් තොරවීම.
(4) විවිධ නියමයන්ට අනුව රංග පීඨය මත ඉදිරිපත් කරන කක්ෂ්‍යා භාවිතය
(5) සංවාද එදිනෙදා ජීවිතයේ යෙදෙන ආකාරයට පමණක් භාවිත කිරීම. (...........)

- ශ්‍රී ලාංකේ ය වේදිකාවේ ද රඟදැක්වුණු පහත නාට්‍ය සහ එම නිර්මාණ ශිල්පීන් ආශ්‍රයෙන් 18 සිට 22 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| මුල් නාට්‍ය | රචකයා | සිංහල පරිවර්තක | අනුවර්තක/පරිවර්ර්තක |
|---|---|---|---|
| රත්නාවලී නාටිකා | ශ්‍රී හර්ෂ | රත්නාවලී | A |
| B | ෆෙඩ්‍රිකෝ ගර්ෂියා ලෝර්කා | මුහුදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |
| ඊඩිපස් | C | ඊඩිපස් | ආරියවංශ රණවීර |
| ඩෝල්ස් හවුස් | හෙන්රි ඉබ්සන් | D | විජිත ගුණරත්න |
| ද කොකේසියන් චෝක් සර්කල් | බ්‍රර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | E | හෙන්රි ජයසේන |

18 . A සඳහා සුදුසු වරණය වන්නේ
(1) පියදාස නිශ්ශංක (2) බන්දුල ජයවර්ධන (3) දයානන්ද ගුණවර්ධන
(4) වෝල්ටර් මාරසිංහ (5) සිරි ගුණසිංහ (...........)

19 . B සඳහා සුදුසු වරණය වන්නේ

(1) ඊඩිපස්
(2) යෙර්මා
(3) හරිම බඩු හයක්
(4) සයුරෙන් ආ ලඳ
(5) හිත හොඳ අම්මණ්ඩි (...........)

20. C සඳහා සුදුසු වරණය වන්නේ

(1) යුරිපිඩීස්
(2) ඇරිස්ටොෆානිස්
(3) ඇන්ටන් චෙකොෆ්
(4) සොෆොක්ලීස්
(5) ඊස්කිලස් (...........)

21 D සඳහා සුදුසු වරණය වන්නේ

(1) ජන හතුරා
(2) රූකඩ ගෙදර
(3) සහුරෙන් ආ ලඳ
(4) සමාජ කුළුණු
(5) චෙරි උයන (...........)

22 E සඳහා සුදුසු වරණය වන්නේ

(1) අවතාර
(2) විලාසිනියකගේ ප්‍රේමය
(3) දිරිය මව සහ ඇගේ දරුවෝ
(4) හුණුවටයේ කතාව
(5) හිතහොඳ අම්මණ්ඩි (...........)

23 සී දොන් බස්තියන් සම්බන්ධ වන්නේ

(1) ඉංග්‍රිසි නාට්‍ය කලාවටය.
(2) කෝලම් නාට්‍ය කලාවටය.
(3) සොකරි නාට්‍ය කලාවටය.
(4) නාඩගම් නාට්‍ය කලාවටය.
(5) නූර්ති නාට්‍ය කලාවටය. (...........)

24 "සුවඳ පත්ම ඕලු ආදී " ගීතය ඇතුලත් නාට්‍ය වන්නේ

(1) පත්මාවතී (2) දුටුගැමුණු (3) සිරිසඟබෝ (4) රාමායණය (5) බ්‍රම්පෝට් (...........)

25 සන්නියකුම් යාගයේ ගොටු හතරක් සහිත ඉණ හැඩයක් පළඳින්නේ කුමන සන්නියද?

(1) දේව සන්නිය (2 ) බිහිරි සන්නිය (3) මහාකෝල සන්නිය
(4 ) අමුක්කු සන්නිය (5) පිත් සන්නිය (...........)

26 සිංහල වේදිකා නාට්‍ය ඉතිහාසයේ ප්‍රථම වරට කැරකෙන වේදිකාවක් උපයෝගී කරගත් නාට්‍ය කුමක්ද?

(1) නිග්‍රෝධ නාට්‍ය
(2) බක්මහ අකුණු නාට්‍ය
(3) ගජමන් පුවත නාට්‍ය
(4) මනරංජන වැඩවර්ජන නාට්‍ය
(5) තට්ටුගෙවල් (..........)

- ප්‍රශ්න අංක 27 සිට 31 දක්වා එක් එක් ප්‍රශ්න සඳහා වරණ පහක් බැගින් සපයා ඇත. ඒ අතරින් සෙසු පද හා නොගැලපෙන පදය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

27 (1) ශින් (2) නන් (3) න්යෝ (4) ක්යෝ (5) චකි (..........)
28 (1) ෂිරසු (2) තයිකෝ (3) කගමිනොම (4) හෂිකගරි (5) අගමෙකු (..........)
29 (1) හනමිචි (2) කුමදොරි (3) සෙරිදෙෂි (4) සෙරිඅගේ (5) මවරිබුතයි (..........)
30 (1) ගිදයු (2) නගඋත (3) සෙරිෆු (4) නොකිවසු (5) කියොමොතෝ (..........)
31 (1) ෂිතේ (2) ෂිතේ ත්සුරේ (3) චකි (4) හයිෂි (5) කොකතා (..........)

32 . මහාචාර්ය එස්. විද්‍යානන්දන්ගේ රංග කටයුතු සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1).1975 දී නාට්‍යකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ආරම්භ කිරීම.

(2).1978 දී " නාටක අරංකන් කල්ලූරි " නාට්‍ය ආයතනය ආරම්භ කිරීම.

(3) "අන්නයි යිට්ටති" නම් වූ මනෝවිද්‍යාත්මක නාට්‍යය නිර්මාණය කිරීම.

(4) 1950-1960 දශක වල දෙමළ නාට්‍ය කලාවේ නව ප්‍රබෝධයත් සමඟ නාට්‍ය ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වීම.

(5) ස්වභාවිකවාදී සම්ප්‍රදායෙන් බැහැරව දේශීය සම්ප්‍රදායට අනුව ශෛලිගත ක්‍රමයට නාට්‍ය නිර්මාණය කිරීම.

(..........)

33 . ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය කලාව සම්බන්ධයෙන් වැදගත් වන දුක්ප්‍රාප්ති ප්‍රසංගය නම් ගද්‍ය කාව්‍ය රචනා කළේ කවුරුන් විසින්ද?

(1) ලෙස්ලි බොතේජු (2) ජාකෝමේ ගොන්සාල්වේස් (3) ලෝරන්ස් පෙරේරා
(4) ක්ලෙමන්ට් ප්‍රනාන්දු (5)මෙරිල් ප්‍රනාන්දු (..........)

34 . කෘෂි කාර්මික ජන ජීවිතය හා සම්බන්ධ දෙමළ ජන නාටක විශේෂය කුමක්ද?

(1) වසන්තන් කූත්තු (2) වඩිමෝඩි (3) තෙන්මෝඩි

(4) මකිඩි (5) කාත්තවරායන් කූත්තු (..........)

35 .නාඩගමෙහි අනාගතවක්තෘ ලෙසින් නම් කරනු ලබන්නේ

(1) පොතේ ගුරු
(2) දේශනවාදීහු
(3) සෙල්ලම් ළමා
(4) බහුභූත කෝළමා
(5) සෙල්ලපිල්ලේ (...........)

36 . තෙන්පාක්කු සහ රෝමානු කතෝලික කූත්තුනාට්‍ය විශේෂ මින් කවර කලාපයක ව්‍යාප්ත වී තිබේද?

(1) මන්නාරම (2) මඩකලපුව (3) වන්නි (4) නුවරඑළිය (5) යාපනය (...........)

37 .විශ්වවිද්‍යාල සිංහල සමිතිය විසින් නිපදවන ලද අනුවර්තන නාට්‍යයක් වන්නේ කුමක්ද?

(1) පබාවතී (2) දෙයියෝ සාක්කි (3) නගරෙන් කෙතට
(4) ඉබේවෙදා (5) බහින කලාව (...........)

38 . සැන්දෑ පිදේනිය සහ උඩුවියන් පෙළපාලිය අන්තර්ගත වන්නේ කුමන ශාන්තිකර්මයේද?

(1) දහඅට සන්නිය (2) දෙවොල් මඩුව (3) සූනියම් කැපිල්ල
(4) මංගර මඩුව (5) රට යකුම (...........)

39 . 1970 දශකයේ ඉංග්‍රීසි නාට්‍ය කලාවේ වර්ධනය උදෙසා පුරෝගාමී වූ ශිල්පියකු වන්නේ,

(1) ලූෂන් ද සොයිසා. (2) ශ්‍රී නිශ්ශංක. (3) එම්. ඩබ්. ජෝශප්.

(4) එච්.සී.එන්. ලැනරෝල්. (5) අර්නස්ට් මැකින්ටර්. (...........)

40. ළමා නාට්‍ය කලාවට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ

(1) ළමා නාට්‍ය යනු ළමුන් විසින් ළමුන් උදෙසා නිර්මාණය කරන්නකි.

(2) ශ්‍රී ලංකාවේ ළමා නාට්‍ය කලාව උදෙසා රාජ්‍ය ළමා නාට්‍ය සම්මාන උළෙලක් පැවැත්වේ.

(3) ළමුන් උදෙසා ලෝක ධර්මී ගණයේ නාට්‍ය නිර්මාණ උචිත නොවේ.

(4) වැඩිහිටියන් ළමා නාට්‍ය නිෂ්පාදනය කිරීම සුදුසු නොවේ.

(5) විවිධ වයස් කාණ්ඩවලට අදාළ ව ළමා නාට්‍ය නිෂ්පාදනය කිරීම අසාර්ථකය. (...........)

II - කොටස

- **A කොටසින් ප්‍රශ්න 2 ක් සහ B කොටසින් ප්‍රශ්න 2 ක් තෝරාගෙන ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සපයන්න.**

A කොටස

01.

I. කෝලම් යන්නෙහි වාච්‍යාර්ථය දක්වා කෝලම් නාටකයේ ප්‍රභවය පිළිබඳව ගොඩනැගී ඇති එක් මතයක් දක්වන්න ( ල.04 )
II. නාඩගම් රංග ශෛලිය සතු ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. ( ල.05 )
III. නාඩගම් කලාව සතු ලක්ෂණ දේශීය නාට්‍ය කලාවේ ගමන් මඟට ඉවහල් වූ ආකාරය දක්වන්න. (ල.06 )

02.

I. රට යකුම් යාගය , සූනියම් යාගය සහ කිරිමඩු යාගය පැවැත්වීමේ අරමුණු කෙටියෙන් දක්වන්න. ( ල.03 )
II. දේශීය ශාන්ති කර්ම තුළ නාට්‍යමය ලක්ෂණ හඳුනාගැනීම අසීරු නොවේ. ඔබ උගත් යක්තොවිල් පමණක් ආශ්‍රය කර ගනිමින් මේ මතය සනාථ කරන්න. ( ල .06)
III. දේශීය ශාන්ති කර්ම,ලාංකීය නාට්‍ය කලාව පෝෂණය කිරීමෙහි ලා ප්‍රබල දායකත්වයක් සපයා ඇත.මෙම මතය සනාථ කරන්න. ( ල.06 )

03.

I. දේශීය නාට්‍ය කලාවේ ප්‍රභවය සහ විකාශනය සිදු වූ ආකාරය කෙටියෙන් දක්වන්න. ( ල.03 )
II. 70 දශකයේ නාට්‍ය කලාවේ ගමන් මග පිළිබඳව කෙටි විග්‍රහයක් කරන්න. ( ල.06 )
III. විශ්වවිද්‍යාලීය නාට්‍ය කලාව (1933-1956) හා නාට්‍ය කරුවන් විසින් සිංහල නාට්‍යයේ ගමන් මඟෙහි සංධිස්ථානයක් සනිටුහන් කරයි. පැහැදිලි කරන්න. ( ල .06 )

B - කොටස

04.

I. කුවේණියගේ පරිත්‍යාගශීලිත්වය කුවේණි නාටකයේ එන එම චරිතය තුළින් ප්‍රකට වේද? පැහැදිලි කරන්න. ( ල.04 )
II. කුවේණියගේ චරිතයේ විවිධ භූමිකා පිළිබඳ පැහැදිලි කරන්න. ( ල.05 )
III. සිය අරමුණු සපල කර ගැනීම සඳහා කුවේණි නාට්‍ය රචකයා ඒ සඳහා ගායන ඡන්දය භාවිත කර ඇති අයුරු පැහැදිලි කරන්න. ( ල .06)

05.

I. අභිඥාන ශාකුන්තලය නාට්‍ය ප්‍රබල ජීවන දෘෂ්ටියක් සපයයි. පහදන්න. ( ල .04)
II. කුවේණිය සහ සකුන්තලා යන චරිතද්වය සිය හැඟීම් ප්‍රකාශනයෙහිලා සපථ කළ ස්වාමි භක්තිය කවරාකාර වේද? පැහැදිලි කරන්න. ( ල.05)
III. නාට්‍ය ප්‍රභේදය සතු ලක්ෂණ අභිඥාන ශාකුන්තලය මගින් පැහැදිලි කරන්න. ( ල.06)

06.

I. ජපානයේ ඉපැරණිම සම්භාව්‍ය නාට්‍ය ප්‍රභේදය නම්කොට එහි ප්‍රභවය කෙටියෙන් දක්වන්න. (ල.04 )

II. ඉහත ඔබ නම් කළ එම ප්‍රභේදය සතු රංග ශෛලිය පැහැදිලි කරන්න. ( ල .05 )

III. සමස්ථයක් ලෙස ජපන් නාට්‍ය කලාව තුළ අන්තර්ගත බෞද්ධාගමික පසුබිම පිළිබඳව විග්‍රහයක් කරන්න. ( ල.06 )